# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1986 අංක 23 දරන ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 අගෝස්තු මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1986 අගෝස්තු මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1986 අංක 23 දරන ශ්‍රී ලංකා නගර නිර්මාණශිල්පීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 අගෝස්තු මස 27 වන දින.]

එල්. ඩී.—ඕ. 50/84

## ශ්‍රී ලංකා නගර නිර්මාණශිල්පීන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී ලංකා නගර නිර්මාණශිල්පීන්ගේ ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන ආයතනයක්, ඒ ආයතනයේ සාමාජිකයන් එකඟ වන රීති අනුව ආයතනය හා සම්බන්ධ සියලු කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කරගෙන හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී ආයතනය පිහිටුවනු ලැබූයේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් ඒ ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද ඒ ආයතනය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1986 අංක 23 දරන ශ්‍රී ලංකා නගර නිර්මාණශිල්පීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ආරම්භ වීමේ දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා නගර නිර්මාණශිල්පීන්ගේ ආයතනයේ දැනට සංස්ථාගත සාමාජිකයන්ව සිටිනතාක් කැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන (සංස්ථාවේ සංස්ථාගත සාමාජිකයන්ව සිටිනතාක් කල්) සංස්ථාගත සාමාජිකයන්ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා නගර නිර්මාණශිල්පීන්ගේ ආයතනය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා නගර නිර්මාණශිල්පීන්ගේ ආයතනය සංස්ථාගත කිරීම.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ උදෙසා ද ඒ පොදු පරමාර්ථ පනතේ දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) නගර නිර්මාණ ශිල්පය සහ කලාව එහි සියලු අංශවලින් දියුණු කිරීම සහ උන්නතියට පත් කිරීම ;

2—ඒ 078492—7,700 (86/08)

(ආ) ශ්‍රී ලංකාවේ නගර නිර්මාණ වෘත්තියෙහි ගරුත්වය සහ කීර්තිය නංවාලීම සහ රැකගැනීම සහ එහි ප්‍රයෝජනය මහජනයාගේ යහපත පිණිස ව්‍යාප්ත කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවේ නගර නිර්මාණ වෘත්තිය සහ විදේශීය නගර නිර්මාණ ආයතන අතර සම්බන්ධතා පැවැත්වීම;

(ඈ) නගර නිර්මාණය පිළිබඳ වෘත්තීය උපදෙස් විමසනු ලබන අවස්ථාවල දී ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට සහ ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල පිහිටි වෙනත් ආයතනවලට එවැනි උපදෙස් ලබා දීම;

(ඉ) ස්වකීය සාමාජිකයන්ගේ ස්වාර්ථ සිද්ධි, තත්ත්වය, ශුභ සිද්ධිය, අයිතිවාසිකම් සහ වරප්‍රසාද ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීම සහ නගර නිර්මාණ වෘත්තියට අදාළව මහජනයාගේ ස්වාර්ථ සිද්ධි ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීම;

(ඊ) ශ්‍රී ලංකාවේ පරිචයෙහි පවත්නා හෝ පරිචයට පත් විය හැකි නගර නිර්මාණ වෘත්තියට අදාළ කටයුතු වර්ධනය කිරීම, සහ ඒ කටයුතු විධිමත් කිරීම;

(උ) නගර නිර්මාණයට අදාළ නවීනතම තොරතුරු අත්කර ගැනීමෙහිලා සහායවීම සහ ඉතාමත්ම ඵලදායී නගර නිර්මාණ ක්‍රම, පරිචයන් හා ක්‍රියා පද්ධති ශ්‍රී ලංකාවෙහි භාවිත කරනු ලබන බවට වග බලා ගැනීම;

(ඌ) නගර සහ ග්‍රාම නිර්මාණය පිළිබඳ දැනුම සහ පරිචය වැඩි දියුණු කිරීමෙහිලා උපකාරී වන පර්යේෂණ සහ අනෙකුත් සියලු ක්‍රියාකාර කම් දියුණු කිරීම;

(එ) ප්‍රජාවේ උපරිම යහපත උදෙසා නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල සෞන්දර්යාත්මක, ආර්ථික, විද්‍යාත්මක සහ සමාජ සංවර්ධනය නංවාලීම;

(ඒ) නගර නිර්මාණ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම අරභයා 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ සඳහන් යම් උසස් අධ්‍යාපන ආයතනයක් සමඟ හෝ වෙනත් පිළිගත් අධ්‍යාපන ආයතනයක් සමඟ එකමුතුව කටයුතු කිරීම;

(ඔ) නගර නිර්මාණය පිළිබඳ න්‍යායික සහ ප්‍රායෝගික දැනුම ප්‍රමාණවත් පරිදි තමන් අත්කරගෙන ඇති බවට සංස්ථාවේ සභාව සෑහීමට පත් කළ තැනැත්තන් පමණක් සංස්ථාවට ඇතුළත් කර ගැනීමෙන්, පිළිගත් නගර නිර්මාණ ශිල්පීන් සේවයෙහි යොදවා ගැනීම කෙරෙහි ප්‍රජාවේ විශ්වාසය වැඩි දියුණු කිරීම;

(ඕ) නගර නිර්මාණ ශිල්පය සහ තදනුබද්ධ විෂයයන් පිළිබඳ දැනුම ලබා ගැනීම හා පතුරුවාලීම සඳහා අවස්ථා සැලසීම සහ ඒ දැනුම ලබා ගැනීම හා පතුරුවාලීම සඳහා පුස්තකාල හා වෙනත් උචිත මාධ්‍ය ඇති කිරීම, ඒවා විධිමත් කිරීම සහ පවත්වාගෙන යාම;

(ක) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ද සංස්ථාවේ සාමාජිකයන් විසින් පවත්වාගෙන යා යුතු වෘත්තීය චර්යා පිළිබඳ ප්‍රමිති ද නියම කිරීම ; සහ

(ග) සාමාන්‍යයෙන් සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම හෝ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ ඊට ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

4 (1) සංස්ථාවේ සාමාජිකත්වය පහත දැක්වෙන ශ්‍රේණිවලින් සමන්විත විය යුතුය :— සාමාජිකත්වයේ ශ්‍රේණි සහ අභිධාන පාවිච්චි කිරීම ආදිය.

මේ පනතේ "සංස්ථාගත සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන

(අ) අධි සාමාජිකයෝ, සහ

(ආ) සාමාන්‍ය සාමාජිකයෝ,

මේ පනතේ "සංස්ථාගත නොවූ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන

(ඇ) ආශ්‍රිත සාමාජිකයෝ, සහ

(ඈ) ශිෂ්‍ය සාමාජිකයෝ.

(2) සංස්ථාවේ සභාවට, යම් කමිටුවකට හෝ යම් මණ්ඩලයකට තෝරා පත් කර ගනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට සංස්ථාගත සාමාජිකයන් සුදුස්සන් වන අතර, රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීම ඇතුළුව සියලු අයිතිවාසිකම්වලට හා වරප්‍රසාදවලට හිමිකම ඔවුන්ට ඇත්තේ ය.

(3) තමන්ගේ ශ්‍රේණියට උචිත වන පරිදි තමන්ගේ නම අගට පහත දැක්වෙන අභිධාන හෝ ඒවායේ කෙටි යෙදුම් භාවිත කිරීමේ අනන්‍ය අයිතිය, එකී අභිධාන හෝ ඒවායේ කෙටි යෙදුම් තම තම අගට යෙදිය හැක්කේ සාමාජිකත්වය සංස්ථාවේ රීතිවලට අනුකූලව වලංගුව බලපවත්නා තාක් පමණක්ය යන කොන්දේසි යට යටත්ව, සංස්ථාගත සාමාජිකයන්ට ඇත්තේ ය :—

නගර නිර්මාණශිල්පීන්ගේ ආයතනයේ අධි සාමාජික (ශ්‍රී ලංකා) ; එෆ්. අයි. ටී. පී. (ශ්‍රී ලංකා)

නගර නිර්මාණශිල්පීන්ගේ ආයතනයේ සාමාජික (ශ්‍රී ලංකා) ; එම්. අයි. ටී. පී. (ශ්‍රී ලංකා)

(4) සංස්ථාවේ සියලු මහා සභා රැස්වීම්වලට පැමිණ සිටීමේ සහ ඒවාට සහභාගිවීමේ හිමිකම සංස්ථාගත නොවූ සාමාජිකයන් සතු වන නමුත් ඒ රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමේ හෝ යම් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට ඉල්ලා සිටීමේ හෝ එවැනි රැස්වීමක් කැඳවීමට කරනු ලබන ඉල්ලීමකට සහභාගිවීමේ හෝ නිලතල දැරීමේ හෝ සංස්ථාවේ සභාවට, යම් කමිටුවකට හෝ වෙනත් මණ්ඩලයකට පත් කරනු ලැබීමේ හෝ අයිතිය ඔවුන් සතු නොවන්නේ ය.

සාමාජිකත්වය සඳහා නුසුදුසුකම් සහ විනයානුකූල බලතල හා කාර්ය පටිපාටිය.

5. (1) යම් තැනැත්තකු,—

(අ) ශ්‍රී ලංකාවේ හෝ අන් රටක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් සිහිවිකල් තැනැත්තකු යයි නිශ්චය කරනු ලැබ සිටී නම්; හෝ

(ආ) බුන්වත් තැනැත්තකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු වශයෙන් ශ්‍රී ලංකාවෙහි හෝ අන් රටක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් නිශ්චය කරනු ලැබ, ඔහුගේ බුන්වත් භාවය හෝ වස්තු භංගත්වය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් නොවලැක්විය හැකි පාඩු විඳීම් හෝ අවාසනාවන්ත සිද්ධීන් නිසා උද්ගත වී ඇති බවට සහතිකයක් ඒ අධිකරණය විසින් ප්‍රදානය කර නොමැතිව සිටී නම්; හෝ

(ඇ) චරිත දූෂණාත්මක වරදක් වන්නා වූ ද බන්ධනාගාරගත කිරීමෙන් හෝ සමාන දඬුවමකින් හෝ දඬුවම් කරනු ලැබිය හැකි වූ ද වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙහි හෝ අන් රටක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ සිටීනම්,

ඒ තැනැත්තා සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් ඇතුළත් කර ගනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් නුසුදුසුකම්වලින් යම් නුසුදුසුකමකට යටත්වන යම් සාමාජිකයකු සභාව විසින් සාමාජික නාම ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල විධිවිධාන යටතේ සාමාජික නාම ලේඛනයෙන් ඉවත් කරනු ලැබූ යම් සාමාජිකයකු එකී නුසුදුසුකමට යටත්ව සිටීම අවසන් වුවහොත් හෝ එකී තැනැත්තා ස්වකීය චරිතය හැඩගස්වා ගෙන සිටින බවද නගර නිර්මාණ ශිල්පියකුගේ වෘත්තියෙහි යෙදීමට සුදුසු බවද සභාවේ මතය වේ නම් සභාව විසින්, සභාවේ අභිමතය අනුව, ඔහු නැවත ඇතුළත් කර ගනු ලැබිය හැකි ය.

(3) වෘත්තීය විෂමාචාරය සම්බන්ධයෙන් වරදක් කර ඇතැයි සභාවේ මතය වන යම් සාමාජිකයකු සභාව විසින් සාමාජික නාම ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද සභාව විසින්, සාමාජික නාමලේඛනයෙන් ඔහුගේ නම ඉවත් කිරීම වෙනුවට එකී සාමාජිකයාට තදින් අවවාද කිරීම හෝ සියලුම අවස්ථාගත කරුණු අනුව සභාව විසින් යුක්ති සහගත යයි හා සාධාරණ යයි සලකන එක් අවුරුද්දක් නොඉක්මවන යම් කාලයක් සඳහා ඔහුගේ සාමාජිකත්වය අත්හිටුවීම කළ හැකි ය:

එසේ ම තවදුරටත් එකී නැනැත්තා ස්වකීය චරිතය කැළැල් ගස්වා ගෙන සිටින්නේ යයි ද නගර නිර්මාණ ශිල්පියකුගේ වෘත්තියෙහි යෙදීමට සුදුසු යයි ද සභාවේ මතය වේ නම්, සභාව විසින්, සභාවේ අභිමතය අනුව, ඔහු නැවත ඇතුළත් කරගනු ලැබිය හැකි ය.

(4) සභාව විසින් පත් කරන ලද විනය කමිටුවක් විසින් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු, ඉහත කී කාරණාවලින් යම් කාරණාවකට යම් සාමාජිකයකු යටත් ව සිටින බවට හෝ වෘත්තීය විෂමාචාරය සම්බන්ධයෙන් වරදක් කර ඇති බවට හෝ සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇත් නම් ඒ ස, සභාව විසින් මේ වගන්තියේ ඉහතින් සඳහන් විධිවිධාන යටතේ කිසියම් සාමාජිකයකු සාමාජික නාමලේඛනයෙන් ඉවත් කිරීම, සාමාජිකත්වයෙන් අත්හිටුවීම හෝ කිසිම සාමාජිකයකුට තදින් අවවාද කිරීම හෝ නොකළ යුතු ය.

6. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත දක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය :— සංස්ථාවේ සාමාන්‍ය බලතල.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීමේ, දැරීමේ, බද්දට හෝ කුලියට ගැනීමේ හෝ දීමේ, උකස් කිරීමේ, ඉඩදානය කිරීමේ, විකිණීමේ හා හුවමාරු කිරීමේ හෝ අන් ආකාරයකින් නියාදනය කිරීමේ බලය ;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම හෝ ඵලදායක ක්‍රියාත්මක කිරීම හෝ සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට හෝ එකඟතාවලට කෙළින්ම හෝ සංස්ථාව විසින් තම කාර්ය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු හෝ අනියෝජිතයකු මඟින් හෝ එළඹීමේ, ඒවා ඉටු කිරීමේ හෝ කරගෙන යාමේ බලය ;

(ඇ) ස්වකීය ඇරමුදල් සංස්ථාවේ සභාව විසින් අනුමත කරන ලද යම් බැංකුවක හෝ බැංකුවල ආයෝජනය කිරීමේ හා ජංගම, තැන්පතු හා ඉතිරි කිරීමේ ගිණුම් පවත්වා ගෙන යාමේ බලය ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා සංස්ථාව විසින් සුදුසු යයි කල්පනා කරන යම් ආකාරයකට හා එසේ සුදුසු යයි කල්පනා කරන යම් ඇපයක් මත මුදල් අත්තිකාරම් දීමේ හෝ ණයට දීමේ හා ණයට ගැනීමේ බලය ;

(ඉ) සාමාජිකත්වය සම්බන්ධයෙන්ද සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සහ සංස්ථාව විසින් පවත්වනු ලබන පාඨමාලාවලට හා විභාගවලට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන්ද ගාස්තු නියම කිරීමේ බලය ;

(ඊ) පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විමසා නගර නිර්මාණ ශිල්පීන් වශයෙන් සුදුසුකම් ලබාගැනීමට බලාපොරොත්තු වන තැනැත්තන් ඇතුළත් කර ගැනීමට අදාළ නියම හා බලය ;

(උ) නිලධරයන් හා සේවකයන් පත් කිරීමේ, සේවයෙහි නියුක්ත කිරීමේ, මාරුකිරීමේ, සේවයෙන් පහ කිරීමේ හා ඔවුන්ට විරුද්ධව වෙනත් විනයානුකූල කටයුතු කිරීමේ බලය සහ ඔවුන්ගේ සේවා නියමයන් හා කොන්දේසි නියම කිරීමේ බලය ; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම හෝ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ ඊට ආනුෂංගික හෝ හිතකර වූ සියලු ක්‍රියා හා දේ කිරීමේ බලය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

7. (1) සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම, සංස්ථාවේ රීතිවලට යටත්ව, සභාවක් වෙත පවරනු ලැබිය යුතු ය. ඒ සභාව විසින් මේ පනත යටතේ වූ සංස්ථාවේ කර්තව්‍ය හා කාර්ය ඉටු කළ යුතු අතර සංස්ථාවේ බලතල ඒ සභාව විසින් ක්‍රියාත්මක කළ හැකි ය.

(2) සංස්ථාවේ සභාව, සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හෝ පත් කර ගනු ලබන වෙනත් යම් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම සභාව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී නිල දරන ආයතනයේ සභාව විය යුතු ය.

රීති සෑදීමේ බලය.

8. (1) නියම කළ යුත යැයි මේ පනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ රීති සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ නියමිත යම් කාරණයක් පිළිබඳව යම් මහා සභා රැස්වීමක දී ඒ රැස්වීමට පැමිණ ඡන්දය දෙන්නා වූ සංස්ථාගත සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නො අඩු ඡන්දයෙන්, සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය. එසේ රීති සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී ඒ ආකාරයෙන්ම ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලින් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැති ව, සභාව විසින්, පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් මේ පනතෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සාදනු ලැබිය හැකිය :—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම සහ පහ කිරීම, සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්, සාමාජිකත්ව සහතිකවල ආකෘතිය හා ඒවා නිකුත් කිරීම, සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාම, සාමාජික ගාස්තු අනුගත වීම හෝ අඩු කිරීම සහ සාමාජික මුදල් නොගෙවීමේ ප්‍රතිඵල හා සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද හා යුතුකම්.

(ආ) සභාවේ ධුර කාලය, සභාවට තෝරා පත් කර ගැනීම හෝ පත් කර ගැනීම සඳහා සුදුසුකම් හා එය කළ යුතු ආකාරය, සාමාජිකයන් ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය අත්හැර යාම සහ සාමාජිකයන්ගේ අනියම් පුරප්පාඩු පිරවීම, සභාවේ බලතල හා කර්තව්‍ය පැවරීම සහ සංස්ථාවේ කමිටු හා මණ්ඩල පත් කිරීම සහ සභාවේ වාර්ෂික වාර්තාව ;

(ඇ) සභාවේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම, වාර්ෂික මහා සභා රැස්වීම, සංස්ථාවේ සාමාජිකයන්ගේ වෙනත් මහා සභා රැස්වීම් හා විශේෂ මහා සභා රැස්වීම්, එකී රැස්වීම් පිළිබඳ දැන්වීම, ඒවායේ න්‍යාය පත්‍රය, ඒවායේ ගණපූරණය සහ ඒවායේ කටයුතු කරගෙන යාම ;

(ඈ) සංස්ථාවේ දේපළ කළමනාකරණය කිරීම හා එහි අරමුදල් භාරව කටයුතු කිරීම ;

(ඉ) වෘත්තීය ආචාරධර්ම රීති සංග්‍රහයක් සකස් කිරීම ;

(ඊ) විනය කමිටු පත් කිරීම හා ඒවාට නීති සහාය ලබාදීම, පැමිණිලි ඉදිරිපත් කරන ආකාරය, චෝදනා පිළියෙල කිරීම, ඒවාට පිළිතුරු වශයෙන් නිදහසට කරුණු ඉදිරිපත් කිරීම, දැන්වීම් නිකුත් කිරීම, සාක්ෂි දීම සඳහා යම් තැනැත්තකු කැඳවීම, ලේඛන ඉදිරිපත් කිරීම, නීතිඥයන් මගින් කරුණු කියා සිටීමට පාර්ශ්වකරුවන් සතු අයිතිවාසිකම්, එහිලා අදාළ වන සාක්ෂි පිළිබඳ රීති, පරීක්ෂණ කටයුතුවල වාර්තා තබා ගැනීම සහ විනය කමිටුවල වාර්තාවල ආකෘතිය හා ඒවායෙහි අඩංගු කළ යුතු කරුණු ඇතුළු ව විනයානුකූල පරීක්ෂණ පිළිබඳව වූ කාර්ය පරිපාටිය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට යටත් විය යුතු ය.

අභිධාන ආදිය, පාවිච්චි කිරීම සීමා කිරීම.

9. (1) 4 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි සඳහන්ව ඇත්තා වූ ද සංස්ථාගත සාමාජික පන්තියේ යම් ශ්‍රේණියකට බඳවා ගෙන සිටින සාමාජිකයකු විසින් පමණක් ඒ උපවගන්තිය යටතේ ගැනීම හෝ භාවිතා කිරීම හෝ කරනු ලැබිය හැකි වූ ද යම් අභිධානයක් හෝ අභිධානයක කෙටි යෙදුමක්, තත් කාල යෙහි ඒ ශ්‍රේණියේ සාමාජිකයකු වශයෙන් ඇතුළත් කොට ගෙන ඇති තැනැත්තකු විසින් මිස, වෙනත් තැනැත්තකු විසින් ගැනීම හෝ භාවිත කිරීම හෝ නොකළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත් වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාර ගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් වන්නේය.

(3) සභාව විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය පවරනු ලැබූ සභාවේ සාමාජිකයකු විසින් හැර වෙනත් තැනැත්තකු විසින් මේ වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් කරනු නො ලැබිය යුතු ය.

ආයතනය විසින් ගෙවියයුතු හා ආයතනයට අය විය යුතු ණය.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන අවස්ථාවේ පවත්නා ආයතනයේ සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු හෝ නිදහස් කළ යුතු අතර, ආයතනයට අයවිය යුතු සියලු ණය, දායක මුදල්, සම්මාදම් මුදල් සහ ගාස්තු, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**11.** සභාවේ යෝජනා සම්මතයක බලය යටතේ සහ සභාවේ සාමාජිකයන් දෙදෙනකු ද ලේකම්වරයා හෝ තත් කාර්යය සඳහා සභාව විසින් බලය දෙනු ලබන වෙනත් යම් තැනැත්තකු ද ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නො ලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තු ප්‍රඥප්ති පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 150 යි (විදේශීය) රු. 300 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කල් ඇතිව පරිපාලන දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව ... ... ... ලබාගත හැකිය.